ශ්‍රී ජයවර්ධනපුර අධ්‍යාපන කලාපය

6 - ශ්‍රේණිය ඉතිහාසය I , II

දෙවන වාර වාර්ෂික පරීක්ෂණය - 2014

කාලය පැය 02 යි

නම / විභාග අංකය : ........................................................................................

## I පත්‍රය

❖ ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න.

❖ වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

(01) ඉතිහාසය හැදෑරීමෙන් අපට ලද හැකි වැදගත්ම ප්‍රයෝජනය වන්නේ,

(1) රටක භූගෝලීය සාධක ගැන දැනගැනීම.

(2) අනෙකුත් ජාතීන්ට වඩා ඉහළින් සිටීම.

(3) මානව ශිෂ්ටාචාරයේ ආරම්භයේ සිට තොරතුරු දැනගැනීම.

(4) යුද්ධ කටයුතුවලට ප්‍රයෝජනවත් වීම.

(02) ලංකා ඉතිහාසය හැදෑරීමට වඩාත් වැදගත් ග්‍රන්ථය වන්නේ,

(1) ජාතක කථා පොත (2) රාමායනය

(3) මහා වංශය (4) දීප වංශය

(03) දඩයම් යුගයේ මිනිසා ඇඳුම් සඳහා භාවිත **නොකළේ**,

(1) කොළ අතු (2) ගස්වල පට්ටා (3) සත්ත්ව හම් (4) රේදි රෙදි

(04) මානව සංවර්ධනයේ කාල බෙදිය හැකි කොටස් පිළිවෙලින් දැක්වූ විට,

(1) දඩයම් යුගය, එඬේර යුගය, ගොවියුගය

(2) ගල් යුගය, දඩයම් යුගය, ගොවි යුගය

(3) දඩයම් යුගය, එඬේර යුගය, කුඩාරම් යුගය

(4) ගල් යුගය, එඬේර යුගය, කුඩාරම් යුගය

(05) දඩයම් යුගයේදී ගින්දර යොදා ගත්තේ,

(1) මස් පුළුස්සා ගැනීමට, සතුන්ගෙන් ආරක්ෂාවීමට හා උණුසුම ලබා ගැනීමට.

(2) ආලෝකය ලබා ගැනීමට, ගිනි දෙවියන් පිදීමට හා එය වටා නැටීමට.

(3) සතුන් දඩයම් කිරීමට, මස් වියළීමට හා යාග හෝම කිරීමට.

(4) ඇඳුම් වියළීමට, ආලෝකය ලැබීමට, ආහාර රත්කිරීමට.

(06) එඬේර යුගයේ මිනිසාගේ ජීවිතයේ විශේෂ ලක්ෂණය වූයේ,

(1) එළිමහන් සිට්ටනිවල ජීවත්වීමයි.

(2) තවදුරටත් ගල්ගුහාවල හා ගස්බෙනවල ජීවත්වීමයි.

(3) ස්ථිර වාසස්ථාන ගොඩනඟාගෙන ජීවත්වීමයි.

(4) සතුන්ට තණ කැවීම පිණිස සංචාරක ජීවිතයක් ගත කිරීමයි.

(07) ලංකාවට පැමිණි ආර්යයන් පළමුව ජනාවාස පිහිටුවා ගත්තේ,

(1) කඳු බෑවුම්වලය. (2) ගංගා නිම්න අසලය.

(3) මුහුදු වෙරළ ආසන්නයේ ය. (4) වැව් ආශ්‍රිතවය.

(08) විජය කුමරු ලංකාවට පැමිණි කථා පුවත ඇසුරින් එකල ලංකාවේ කුමන කර්මාන්තයක් පැවති බවට සාධක ඉදිරිපත් වේද?

(1) පේෂ කර්මාන්තය (2) වළං කර්මාන්තය

(3) වඩු කර්මාන්තය (4) ආභරණ කර්මාන්තය

(09) ඉතිහාස ග්‍රන්ථ අනුව විජය කුවේණි කථා පුවත පිළිබඳ නිවැරදි අදහසක් වන්නේ,

(1) විජය කුමරු ඇතුළු පිරිස පැමිණි දිනයේ මුහුද ගොඩගලන ලදී.

(2) විජය ඇතුළු පිරිස තම්බපණ්ණියට ගොඩ බැසීම හා බුදුන්වහන්සෙගේ පිරිනිවන්පෑම එකම දවසක සිදු වී ඇත.

(3) විජය කුමරු හා පඬුවස්දෙව් කුමරු යන දෙදෙනා එකවර පැමිණි බව.

(4) විජය පැමිණි දිනයේදී මිහිඳු හිමියන් ද ලංකාවට පැමිණි බව.

(10) පණ්ඩුකාභය කුමරු කුඩා කළ ඇති දැඩි වූයේ,

(1) දොරමඬලාව ග්‍රාමයේ ය. (2) චිත්තල පබ්බත ග්‍රාමයේ ය.

(3) අනුරාධ ග්‍රාමයේ ය. (4) පඬුවස්නුවර ග්‍රාමයේ ය.

(11) පණ්ඩුකාභය කුමරු කුඩා කළ ගොපලු තරුණයන් සමග සිටින විට මරණයෙන් ගැලවුණේ,

(1) දිය නෑමට ගොස් සිටි නිසා ය.

(2) ගින්දර ගෙන ඒමට නිවසට ගොස් සිටි නිසා ය.

(3) රාජපුරුෂයන් සමග සටන් කළ නිසා ය.

(4) දුවගෙන ගොස් දිවි බේරා ගත් නිසා ය.

(12) පණ්ඩුකාභය කුමරුගේ මව වූ චිත්‍රා කුමරිය උන්මාද චිත්‍රා යන නාමයෙන් හැඳින්වූයේ,

(1) ඇය උමතු රෝගයකින් පෙළුණ නිසා ය.

(2) ඇය අන් අයගෙන් සැඟවී සිටීමට ප්‍රිය කළ නිසා ය.

(3) ඇය ඉතා හිතුවක්කාර ක්‍රියා කළ නිසා ය.

(4) ඇය අතිශයින් ම රූමත් වූ නිසා ය.

(13) "මම බුදුන් දහම් සඟුන් සරණ ගියෙමි එසේම භාග්‍යවතුන් කෙරෙහි පැහැදී සිටිමි. එහෙයින් මිතුර ඔබද උතුම් තෙරුවන් සරණ යනු මැනවි" යනුවෙන් දෙවානම්පියතිස්ස රජුට පණිවුඩයක් එවනු ලැබුයේ,

(1) ධර්මාශෝක රජුය (2) සුද්ධෝදන රජුය

(3) බිම්බිසාර රජුය (4) මිහිඳු හිමියන්ය

(14) ශ්‍රී ලංකාවේ පළමු බෞද්ධ රජතුමා ලෙස සැලකෙන්නේ,

(1) දුටුගැමුණු රජුය

(2) දේවානම්පියතිස්ස රජුය

(3) පණ්ඩුකාභය රජුය

(4) විජය රජුය

(15) මිහිඳු හිමි ඇතුළු පිරිස ලංකාවට වැඩම කළේ පහත කුමන වැදගත්කමක් සහිත දිනයක ද?

(1) පොසොන්පුර පසළොස්වක දිනය

(2) වෙසක්පුර පසළොස්වක දිනය

(3) ඇසළපුර පසළොස්වක දිනය

(4) මැදින්පුර පසළොස්වක දිනය

(16) පසු කාලයේ ඉතා පූජනීයත්වයට පත් වූ බිමකි මහමෙව්නා උයන. එම උයන සඟ සතුකොට පූජාකල රජු වන්නේ,

(1) එළාර රජු (2) මුටසීව රජු

(3) දේවානම්පියතිස්ස රජු (4) පණ්ඩුකාභය රජු

(17) බුද්ධාගම ලැබීමෙන් පසු ලංකාවේ ඉදි වූ ප්‍රථම දාගැබ වන්නේ,

(1) රුවන්වැලි සෑයයි (2) අභයගිරියයි (3) ලංකාරාමයයි (4) ථූපාරාමයයි

**18 - 20 දක්වා ප්‍රශ්නවලට ලංකා සිතියම ඇසුරින් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

(18) කදම්බ නදිය (මල්වතු ඔය) දැක්වෙන අංකය ලියන්න.

(1) 1 (2) 2 (3) 3 (4) 4

(19) අනුරාධපුර නගරය දැක්වෙන අක්ෂරය වන්නේ,

(1) E (2) F (3) G (4) H

(20) විජය කුමරු ඇතුළු පිරිස ගොඩබසින ලද ස්ථානය

(1) G (2) F (3) E (4) H

ලකුණු 2 x 20 = 40



## 6 ශ්‍රේණිය - ඉතිහාසය
## II පත්‍රය

**පළමු ප්‍රශ්නයටත් තවත් ප්‍රශ්න 4 කටත් පමණක් පිළිතුරු සපයන්න.**

(01) දෙවන වාරයේ පාසල පදනම් කරගත් ඇගයීම් ක්‍රියාවලියේ වැදගත් රජවරු පිළිබඳ වගන්ති ලියා ප්‍රදර්ශනය කිරීමේ ක්‍රියාකාරකම ඇසුරින් පිළිතුරු ලියන්න.

(i) මේ සඳහා යොදාගත් රජවරු දෙදෙනෙකුගේ නම් ලියන්න. (ල.2)
(ii) මෙහිදී ඔබ කණ්ඩායම සකස්කළ ප්‍රදර්ශන පුවරු දෙකක සඳහන් කළ දේ ලියා දක්වන්න. (ල.4)

(iii) මෙහිදී ඔබට ලැබුණු ගුරු උපදෙස් 2 ක් ලියන්න. (ල.4)
(iv) මෙම ක්‍රියාකාරකම තුළින් ඔබ ලද ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න. (ල.4)
(v) ක්‍රියාකාරකම කිරීමේදී මුහුණ පෑ ගැටළු 2 ක් සඳහන් කරන්න. (ල.2)

(02) (i) ඉතිහාසය පිළිබඳ නිර්වචන ඉදිරිපත් කළ දෙදෙනෙකු නම් කරන්න. (ල.2)
(ii) ඉතිහාසය ඉගෙනීමේ ප්‍රයෝජන 2 ක් සඳහන් කරන්න. (ල.4)
(iii) පාසල් ඉතිහාසය ඉගෙනීමට ඇති මූලාශ්‍ර 3 ක් නම් කර එකක් ගැන කෙටියෙන් පැහැදිලි කරන්න. (ල.5)

(03) (i) මිනිසා මුලින් ම හීලෑ කරගත් සතුන් දෙදෙනෙකු නම් කරන්න. (ල.2)
(ii) එඬේර ජීවිතයේ ලක්ෂණ 4 ක් ලියන්න. (ල.4)
(iii) ගොවි යුගයේදී සතුන් ඇති කිරීමෙන් ලබාගත් ප්‍රයෝජන 5 ක් ලියන්න. (ල.5)

(04) (i) විජය ඇතුළු පිරිස ලංකාවට එනවිට මෙහි වාසය කළ ජනවර්ග 2 ක් සඳහන් කරන්න. (ල.2)
(ii) විජයගේ ඇමතිවරු 4 දෙනෙක් ඇති කළ ජනාවාස 4 ක් නම් කරන්න. (ල.4)
(iii) විජය රජුගෙන් පසුව පැමිණි ආර්යය කණ්ඩායම් දෙකක් ගැන විස්තර ලියා දක්වන්න. (ල.5)

(05) (i) පණ්ඩුකාභය කුමරුට උදව්කළ යක්ෂ ගෝත්‍රිකයන් දෙදෙනා නම් කරන්න. (ල.2)
(ii) කුඩා කළ පණ්ඩුකාභය කුමරු මාමාවරුන්ගෙන් දිවි බේරාගත් අවස්ථා 2 ක් සඳහන් කරන්න. (ල.4)
(iii) පණ්ඩුකාභය රජු අනුරාධපුරය සැලසුම් සහගත නගරයක් බවට පත් කිරීමට කළ දේවල් 5 ක් ලියා දක්වන්න. (ල.5)

(06) (i) දේවානම් පියතිස්ස රජු ඉදිකළ වැව් දෙකක් නම් කරන්න. (ල.2)
(ii) ඉන්දියානු ක්‍රමයට විධිමත් රාජාභිෂේකයක් පැවැත්වීමට එවන ලද රාජ කකුධ භාණ්ඩ 4 ක් නම් කරන්න. (ල.4)
(iii) දේවානම්පියතිස්ස රජුගේ ආගමික සේවය ගැන කෙටි විස්තරයක් ලියන්න. (ල.5)

(07) (i) දුටුගැමුණු රජුගේ මව හා පියා නම් කරන්න. (ල.2)
(ii) දුටුගැමුණු රජුගේ හමුදාවේ සිටි යෝධයන් 4 දෙනෙකු නම් කරන්න. (ල.4)
(iii) දුටුගැමුණු රජු අපේ රටේ සිටි ශ්‍රේෂ්ඨ රජ කෙනෙකි. එය පැහැදිලි කිරීමට කෙටි විස්තරයක් ලියා දක්වන්න. (ල.5)